
08

# රැය පහන් වෙයි




1. අඳුර මකයි සඳකිරණින් පොළෝ තලේ
   තරුවැල් පිරී දිලිසෙයි නිල් අහස් තලේ
   කොඳමල් කැකුළු හිනැහෙයි පිබිදෙමින් විලේ
   මෙහැම එක් ව පිය දසුනකි උද කළේ

2. කුරුලු පැටව් මවු තුරුලේ නිදියන්නෝ
   කණමැදිරියෝ ආලෝකය සපයන්නෝ
   තණපෙත්තෝ ගී ගයමින් තුටුවෙන්නෝ
   බකමූණෝ හුම් හුම් ගා නද දෙන්නෝ

3. ගොළුකර ලොව ම තද ගනඳුර පැතිර ගියා
   මිහිදුම් සළුව පොරවා සුරගනන් ගියා
   මී අඹ සුවඳ විහිදී යන දිසා සොයා
   වවුලු රැන් ඉගිළෙති රැය අපේ කියා

4. දහවල නොලද දෑ සතු කර ගෙන හීනෙන්
බිලිඳා නිදයි නරනිඳු මෙන් කිරුළු පළන්
හෙට දින ගොඩ නගන්නට ගත සවිය දෙමින්
රෑ කල ගෙවී යයි නිදිගත් ලොවට හොරෙන්



5. රැයක් පුරා නිදි කළ ලොව තනි කරලා
අඳුර පැන දුවයි හිරු එන බව දැකලා
කඩිසර ලොවක් ගොඩ නැගුමට දිරි දීලා
කුකුළා හඬ නගයි සුබ නැකතක් කියලා

6. අරුණලු පොකුරු නැග එයි පෙර දිග අහසේ
පිනි කැට විසිර යයි නිල් තණ කොළ බිස්සේ
මල් ගොනු සැලෙයි අතු ඉතිවල අග්ගිස්සේ
මඳනල ගෙනෙයි ආසිරි කැන් හෙට දවසේ

## පැහැදිලි කිරීම්

| | |
|---|---|
| සඳකිරණ | සඳරැස් |
| කොඳමල් | රාත්‍රි කාලයේ දී ජලයෙහි පිපෙන සුදු පැහැති කුඩා මල් වර්ගයකි. |
| පිය දසුන | සතුට ඇති කරවන දර්ශනයක්. |
| මිහිදුම් සළුව | මීදුම නැමැති සළුව |
| කිරුළු පළන් | ඔටුනු පැළඳි |
| සවිය | ශක්තිය |
| දිරි | ධෛර්ය |
| අරුණලු | උදේ පාන්දර හිරු පායාගෙන එන විට විහිදෙන ආලෝකය |
| ගොනු | සමූහයක් |
| තණ කොළ බිස්සේ | තණ කොළ පඳුරුවල |

## ක්‍රියාකාරකම්

01) කවි පෙළ කණ්ඩායම් වශයෙන් හා තනි තනි ව ගායනා කරන්න.

02) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i රාත්‍රියක දැකිය හැකි ලක්ෂණ මොනවා ද?

ii “තරුවැල් පිරී දිලිසෙයි නිල් අහස් තලේ” යන පදයෙන් ඔබට ඇති වන සිතුවිලි මොනවා ද?

iii වවුලන් රැය අපේ යැයි කියන්නේ කුමක් නිසා ද?

iv බිළිඳා ඔටුනු පළන් රජෙකුට සමාන කර ඇත්තේ ඇයි?

v හිරු උදවන බව කවි පෙළෙන් ඉදිරිපත් කර ඇත්තේ කෙසේ ද?

vi පස්වන කවියෙන් කවියා පවසන්නේ කුමක් ද?

03) මේ කවි පංතියෙන් ඔබ කැමැති කවියක් ගායනා කරන්න.
එම කවිය මගින් ඔබ ලබන අත්දැකීම් කෙටියෙන් පැහැදිලි කරන්න.

04) මේ වචන ගොනුවල තේරුම විමසන්න.

| | |
|---|---|
| තරුවැල් | පිනි කැට |
| වවුලු රැන් | මල් ගොනු |
| අරුණලු පොකුරු | ආසිරි කැන් |

## භාෂා භාවිතය

වැල්, රැන්, පොකුරු, කැට, ගොනු, කැන් යන පදවලින් සමූහයක් ගැන ප්‍රකාශ වේ. එසේ සමූහයක් (ගොඩක්) හඟවන පද "සමූහාර්ථවාචී පද" වේ.

01) පහත සඳහන් වාක්‍ය කියවන්න.

තරු වැල් දිලිසෙයි.
වවුලු රැන් ඉගිළෙති.
අරුණලු පොකුරු නැඟ එයි.
පිනි කැට විසිර යයි.
මල් ගොනු සැලෙයි.

02) පහත 'අ' ගොනුවේ ඇති නාමවලට වඩාත් ගැළපෙන සමූහාර්ථවාචී පද 'ආ' ගොනුවෙන් තෝරා යා කරන්න.

| (අ) | (ආ) |
|---|---|
| සිසු | වැළ |
| මුතු | කැල |
| කොක් | පිරිස |
| මල් | පෙළ |
| ගායක | පොකුරු |

03) ඔබ සැකසූ සමූහාර්ථවාචී පද යොදා වාක්‍ය පහක් ලියන්න.

04) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැන් සඳහා වඩාත් ගැළපෙන සමූහාර්ථවාචී පද රවුමෙන් තෝරා යොදන්න.

i. සිසු .......... පන්තියට පැමිණියහ.
ii. මිදි ............. රතු පැහැයෙන් බබළයි.
iii. හරක් ................ තණ කොළ කති.
iv. අම්මාගේ කරේ බැඳි පබළු ......... බබළයි.
v. මගේ සපත්තු ........... කැඩුණි.
vi. ඊයේ ඇමති ............ රැස්වූහ.
vii. මල් .............. පර වී ඇත.
viii. පඩි ............. උස වැඩියි.

මණ්ඩලය, පේළි,
පොකුර, වැළ, කැල,
කුට්ටම, ගොන්න,
රංචුව

05) පහත දැක්වෙන සමූහාර්ථවාචී පද යොද වාක්‍ය ලියන්න.

i තාරකා සමූහයක්
ii කවි පෙළ
iii කුකුළු පට්ටිය
iv නළුනිළි කණ්ඩායම
v භාණ්ඩ තොගය

06) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැන් සඳහා සුදුසු ක්‍රියා පද තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. හොරු රංචුව පලා ................. (ගියේ ය, ගියෝ ය.)
ii. මාළු අහිත පීනා ...................... (යති, යයි.)
iii. ලණු කැරැල්ල ........................... (එල්ලෙයි, එල්ලෙති.)
iv. කුරුලු රැන ....................... (ඉගිළෙයි, ඉගිළෙති.)
v. තරු පෙළ ......................... (බබළති, බබළයි.)

07) පහත දැක්වෙන කවි තාලයට ගායනා කරන්න.

සමන් පිච්ච මල් ඉහිරුණු
නිල් තණකොළ පිට්ටනියක්
වගෙයි අහස අන්න බලනු
කොච්චර ලස්සන ද රෑට

බකමූණෝ පියාඹති
අනෙක් කුරුල්ලෝ නිදති
බෝ අතුවල එල්ලී ගෙන
මා වවුලෝ කෑගසති

මගෙ සුරතල් අක්කාගේ
මාලේ මුතු ඇට වාගේ
මේ වැටෙන්නෙ පිණි බිංදුත්
හදමු එකක් ඒ වාගේ

අහසේ තරු මල් පිරිලා
පොළොවේ සුදුමල් පිපිලා
මඟුල් ගෙවල් දෙකක් වගෙයි
මේ දෙපොළ ම හැඩ ගැහිලා

හඳහාමී අප දිහාව
එබී බලයි පා හිනාව
සිසිල් සුළං දැල් විදින්න
දෙරට යන්න හොඳ වෙලාව

(ඇස්. මහින්ද හිමි)

08) අතිරේක කියවීම්

## සමනලයා

උයන් කෙළි කෙළන මල් කුමරියන් කෙරෙන්
අරන් රොන් රසය මල් කුමරකුගෙ යුරෙන්
බියෙන් මෙන් පියාඹන හැටි මටත් හොරෙන්
මගෙන් ඔබට වරදක් නැහැ ළඟට වරෙන්

නිල් වන් අහසෑ තනියම ඔය බමන්නේ
සෙල්ලම් කරන්ට ද උඹ මට කියන්නේ
මල් පෙති ලෙසින් මේ අත්තටු පෙනෙන්නේ
මල් ලෝකයේ කොතැන ද උඹ උපන්නේ

යුත් නව සුවඳ මල් ගොමුවල පැණි බොන්ට
සිත් සේ සුතිල් ගුවනෙහි රස විඳ ගන්ට
අත් තටු දෙකක් ඹට මෙන් මට පියඹන්ට
ඇත්නම් මමත් එමි උඹ එක්ක ම යන්ට

ඉන්න තැනක් සොයමින් මෙන් මන පිනවා
අන්න තවත් සමනලයෙක් පියඹනවා
එන්න කිය කියා උං මට අමතනවා
යන්න ද හොඳයි එහෙනම් මා නවතිනවා

# එහෙත් මිදි තද ඇඹුලයි

| | |
|---|---|
| දිනක් | බඩගින්නේ |
| සිවලෙක් තැවී | උන්නේ |
| කෑම | සොයමින්නේ |
| ගොසින් මිදි වත්තකට | වන්නේ |
| | |
| ඉතා උස | මැස්සෙක |
| එ වත්තෙහි එක් | පැත්තෙක |
| විහිදුණු මිදි | වැලෙක |
| ඉදුණු ලොකු පොකුරක් තිබෙනු | දැක |
| | |
| එය කඩා කන | මෙන |
| බොහෝ වේලා උඩ | පැන |
| වෙහෙස වී | නොමඳින |
| මඳක් හති හැර වැටී ඉඳ | ගෙන |
| | |
| “බඩගිනි බව | සැබැයි |
| එහෙත් මිදි තද | ඇඹුලයි |
| කැවොත් බඩ | රිදෙයි |
| නරක දූන දූන කෑම | නොයෙදෙයි” |
| | |
| “බඩගින්නේ | මැරෙම් |
| එහෙත් කිසි කලෙකත් | මම් |
| ඇඹුල් මිදි | මෙ තරම් |
| කඩා කන මෝඩයෙක් නොම | වෙම්” |
| | |
| මිදි වැල දෙස | රොසේ |
| රවා කියමින් | මෙලෙසේ |
| සිනාසී | දුක සේ |
| ගියේ සිවලා කැලෑ | පෙදෙසේ |
| | |
| ඕනෑ දෙය | ලැබුම |
| බැරි ව නොකියා | බැරිකම |
| එය ගරහා | දෙඩුම |
| නිවටයන්ගේ සිරිති කල | හැම |

**“ශික්ෂා මාර්ගය”**
**මුනිදාස කුමාරතුංග**